**1990**

**ශ්‍රී ලංකා හදිසි වෛද්‍ය සේවය**
**இலங்கை அவசர மருத்துவ சேவை**
**Sri Lanka Emergency Medical Service**




# ශ්‍රී ලංකාවේ පූර්ව රෝහල් හදිසි ගිලන් රථ සේවයේ කොටස්කරුවෙකු වන්න!

"1990 ශ්‍රී ලංකා හදිසි වෛද්‍ය සේවය" යනු ශ්‍රී ලංකාවේ පුරෝගාමී හදිසි සත්කාර සහ පූර්ව රෝහල් ගිලන් රථ සේවය වන අතර, එය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. "1990 ශ්‍රී ලංකා හදිසි වෛද්‍ය සේවය" ජීවිත බේරාගැනීමේ මෙහෙවරක යෙදෙන අතර, ගිලන් රථ 322ක් සමඟින් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

අපගේ හදිසි සත්කාර සහ පූර්ව රෝහල් ගිලන් රථ සේවාවන් සපයන, ජීවිත බේරාගැනීමට කැපවූ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගේ අයදුම්පත් කළමණාකාරීත්වය විසින් කැඳවනු ලබයි.

## ප්‍රධාන විධායක නිලධාරී (CEO)

### ප්‍රධාන වගකීම්

- ආයතනයේ සියලුම අංශ වලට උපායමාර්ගික නායකත්වය සහ මඟ පෙන්වීම සැපයීම.
- මෙහෙයුම් විශිෂ්ටත්වය, සේවා සැපයීම සහ ආයතනික වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ධනාත්මක වැඩබිම් සංස්කෘතියක් ගොඩනැගීම; ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩල බැඳීම සහ කාර්ය සාධනය සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය, රජයේ පාර්ශවකරුවන්, හවුල්කරුවන් සහ පරිත්‍යාගශීලීන් සමඟ සමීපව කටයුතු කිරීම.
- අනුකූලතාව, ගුණාත්මක ප්‍රමිතීන් සහ මූල්‍ය තිරසාරභාවය පිළිබඳ අධීක්ෂණය, මූල්‍ය හා මූල්‍ය නොවන වාර්තා සමාලෝචනය කර වැඩිදියුණු කිරීම් සඳහා පියවර ගැනීම.
- ජාතික/ජාත්‍යන්තර සංසදවල සහ මහජන උත්සව වල ආයතනය නියෝජනය කිරීම.
- මෙහෙයුම් කාර්යක්ෂමතාව, දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සහ සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය හා ඩිජිටල් නවෝත්පාදනයන් උපයෝගී කර ගැනීම.
- හදිසි හා අර්බුද කළමනාකරණ මුලපිරීම් මෙහෙයවීම, වේගවත් හා සම්බන්ධීකරණය කළ ප්‍රතිචාර සහ තීරණාත්මක සිදුවීම්වලදී ශක්තිමත් ආයතනික සේවාවන්හි අඛණ්ඩතාව සහතික කිරීම.

### අවශ්‍ය සුදුසුකම් සහ අත්දැකීම්

- පරිපාලන, කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ, මූල්‍ය හෝ හදිසි වෛද්‍ය සේවාවන්හි මූලික උපාධියක් සහ ශාස්ත්‍රපති උපාධියක්, සමඟින් කාර්ය මණ්ඩල 1,000කට වඩා වැඩි ආයතනයක අවම වශයෙන් වසර 12ක කළමනාකරණ අත්දැකීම.

  හෝ

- පරිපාලන, කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ, මූල්‍ය හෝ හදිසි වෛද්‍ය සේවාවන්හි මූලික උපාධියක්, සමඟින් කාර්ය මණ්ඩල 1,000කට වඩා වැඩි ආයතනයක අවම වශයෙන් වසර 15ක කළමනාකරණ අත්දැකීම.

ඊට අමතරව, අපේක්ෂකයින් විසින් පහත දැක්වෙන කුසලතා පෙන්විය යුතුය;

- මෙහෙයුම්, උපායමාර්ගික සැලසුම්කරණය සහ මූල්‍ය අධීක්ෂණය පිළිබඳ ශක්තිමත් හැකියාවන් සහිතව, ප්‍රධාන විධායක නිලධාරී (CEO), ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (COO) හෝ ඊට සමාන උපායමාර්ගික කළමනාකරණ භූමිකාවක ඔප්පු කළ ජ්‍යෙෂ්ඨ නායකත්ව අත්දැකීම.
- විශිෂ්ට සන්නිවේදන, තීරණ ගැනීම සහ ගැටලු විසඳීමේ කුසලතා, බහුවිධ කණ්ඩායම් නායකත්වය සහ බහුවිධ පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස ගනුදෙනු කිරීමේ හැකියාව.
- හදිසි සේවා, සෞඛ්‍ය හෝ රාජ්‍ය අංශයේ පූර්ව අත්දැකීම් තිබීම විශේෂිත වාසියක් ලෙස සලකනු ඇත.

උනන්දුවක් දක්වන අපේක්ෂකයින් තම අයදුම්පත careers@1990.lk වෙත හෝ ලියාපදිංචි තැපෑලෙන් 2025 ඔක්තෝබර් 27 වන දින හෝ ඊට පෙර විද්‍යුත් තැපෑලෙහි විෂය රේඛාවේ හෝ තැපෑලෙන් එවන්නේ නම් ලියුම් කවරයේ ඉහළ මැද කොටසේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් 1990 සුව සැරිය පදනම, අංක 415, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට යොමු කළ යුතුය.